# හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs)ආනයනය කිරීම සඳහා 2022 වර්ෂය සඳහා සුදුසුකම් ලබන ව්‍යාපාරික ආයතන අතර කෝටා ප්‍රමාණය ලබාදීම සඳහා වූ යෝජිත ක්‍රමවේදය

## 1. හැඳින්වීම

ඕසෝන් ක්ෂයකාරක පාලනය කිරීම සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයෙහි පාර්ශවකරුවකු වශයෙන් ශ්‍රී ලංකාව එම සන්ධානයේ විධිවිධානයන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී. ඒ අනුව, මොන්ට්‍රියල් සන්ධානයේ විධායක කමිටුවේ XIX/6 වගන්තියේ විධිවිධාන අනුව සෑම පාර්ශවකාර රාජ්‍යයක්ම 2009 සිට හයිඩ්‍රොක්ලෝරො-ෆ්ලෝරෝකාබන්(HCFCs) ආනයනය කිරීම, අපනයනය කිරීම සහ නිෂ්පාදනය කිරීම පාලනය කිරීම සඳහා වන සැලැස්මට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතුය. ශ්‍රී ලංකාව හයිඩ්‍රොක්ලෝරෝෆ්-ලෝරෝකාබන් (HCFCs) නිෂ්පාදනය හා අපනයනයෙහි නිරත නොවන බැවින් ආනයනික කෝටා යාන්ත්‍රණ ක්‍රමවේදය පමණක් අදාළ වේ. කර්මාන්ත හා සංවර්ධනය ක්‍රියාදාමයට අවම බලපෑමක් ඇති වන පරිදි හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය සීමා කිරීම සඳහා වූ කෝටා ක්‍රමය 2013 සිට ලංකාව තුළ සාර්ථකව ක්‍රියාත්මක වේ. 2009-2010 යන වර්ෂයන් පාදක වර්ෂයන් ලෙස ගෙන එම වර්ෂයන් තුළ ආනයන කරන ලද හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණයෙහි මධ්‍යන්‍ය අගය පදනම් කරගෙන 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාව අදාළ පාදක අගය නිර්ණය කිරීම සිදු කරන ලදී. ගණනය කරන ලද පාදක අගයෙන් 10%ක් අඩු කළ පසු අගය 2013-2015 වසරවල ශ්‍රී ලංකාවට වාර්ෂිකව ආනයනය කළ හැකි වූ කෝටා ප්‍රමාණය වූ අතර මේ වන විට එම අදියර සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. දෙවන අදියර යටතේ එනම්, 2020 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා 2013 වර්ෂයේ පාදක අගයෙන් 35%කින් අඩු කිරීමෙන් පසු ලැබෙන අගය අනුව ආනයන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.මේ ආකාරයට 2030 වසර වන විට හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ඉවත් කිරීමේ සැලැස්මට අනුව ශ්‍රී ලංකාව හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ශීතකාරක ආනයනය කිරීම සිදු කරනු නොලැබේ.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය විසින් පහත දක්වා ඇති ක්‍රියාපටිපාටි මඟින් සුදුසුකම් ලබන ආනයනකරුවන් වෙත හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය කිරීම සඳහා නිර්දේශ නිකුත් කරනු ලබන අතර එම නිර්දේශය පදනම් කරගෙන ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව විසින් ආනයනික බලපත්‍ර නිකුත් කිරීම සිදු කරයි. ඉන්පසු එක් එක් ආනයනකරුවන් විසින් ආනයන කරනු ලබන හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) රසායනික ද්‍රව්‍ය අඩංගු සිලින්ඩර් තොග ශ්‍රී ලංකා රේගුව විසින් මුදා හැරීම සිදු කරනු ලබන්නේ ඒ ආශ්‍රිත ආනයනික ලේඛන සත්‍යාපනය කිරීමෙන් හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් හර සටහන් පත්‍රය (Debit Note) නිකුත් කිරීමෙන් අනතුරුව වේ.

ශීතකරණ හා වායුසමීකරණ ක්ෂේත්‍රයේ ආනයනකරුවන් කිහිප දෙනෙකු අතර දීර්ඝ කාලයක් තිස්සේ පැවති ඒකාධිකාරය හේතුවෙන් මෑත කාලීනව බිම් මට්ටමේ ව්‍යාපාරික ආයතනවලට ඇති වූ සෘණාත්මක බලපෑම සැළකිල්ලට ගනිමින්, 2017 ජූලි 25 දිනැතිව ලබාගත් අමාත්‍ය මණ්ඩල තීන්දුවක් අනුව පරිසර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවක් මඟින් හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනකරුවන් අතර විධිමත්ව පරිදි බෙදාදීමට ක්‍රමවේදයක් සැකසීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2018 වර්ෂයේ සිට මේ සඳහා හඳුන්වා දුන් නව ක්‍රමවේදය අනුගමනය කරමින් කෝටාව බෙදාදීම සිදුකරන ලදී. කෙසේවෙතත් 2021 වර්ෂයේ පවත්නා ක්‍රමවේදයේ දුර්වලතාවයන් කිහිපයක් හඳුනාගෙන ඇති අතර එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා සංශෝධන කිහිපයක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඒවා පදනම් කර ගනිමින් 2022 කෝටා බෙදා දීමේ ක්‍රමවේදය සකස් කරනු ලැබේ.

## 2. සුදුසුකම් පරීක්ෂා කිරීමේ පොදු නිර්ණායක

හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) භාවිතා කරමින් ශීතකරණ සහ වායු සමීකරණ (RAC) අංශයේ සේවා සැපයීම, එකලස් කිරීම සහ ස්ථාපනය කිරීම හෝ හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ශීතකාරක සහ උපකරණ ආනයනය කිරීම 2017-2021 දක්වා (පසුගිය වසර 05 තුල) සක්‍රියව කටයුතු කරන ආයතන සහ පුද්ගලයින් 2022 සඳහා හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනයනික කෝටාව අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. අයදුම්පත් කැඳවීම දේශීය පුවත්පත්වල පළ කරනු ලබන (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) දැන්වීමක් මඟින් සිදු කෙරේ.

### 2.1. හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනික කෝටාව ලැබීම සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය ලියකියවිලි

2022 වසර සඳහා හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනික කෝටා ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලේඛන පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

a) නිසි පරිදි පුරවා අත්සන් කරන ලද අයදුම්පත
b) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික කළ පිටපතක්
c) ව්‍යාපාරයේ අයිතිකරුවන් / හවුල්කරුවන්ගේ විස්තරය (අදාළ වේ නම් පමණි)
d) TIN සහ VAT සහතිකයේ පිටපත්
e) පසුගිය වසර 5 තුළ (2017-2021) හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ශීතකාරක ආනයනය කිරීම හෝ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) භාවිතා කර සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකළස් කිරීම පිළිබඳ සාධනය කළ හැකි ලියකියවිලි.

## 2.2 අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සහ නුසුදුස්සන් කිරීම

පහත සඳහන් තත්ත්වයන් යටතේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

a) 2.1 හි සඳහන් ලේඛන සැපයීමට නොහැකි වීම
b) වංචනික ලේඛන සැපයීම.
c) සමාගම් රෙජිස්ටාර්ගෙන් ලබාගනු ලබන පැහැදිලි කිරීම්වලට අනුව සමාගමක් ලෙස පිළිගත නොහැකි අයදුම් පත්‍ර හෝ වංචනික ක්‍රියා හේතුවෙන් අසාධු ලේඛනවල නම සඳහන් ආයතන.
d) පසුගිය වර්ෂයන්හිදී ශීතකාරක ආනයනය කිරීමේදී, සේවාවන් කිරීමේදී හෝ වෙළඳාම් කිරීමේදී නීතිවිරෝධී ලෙස කටයුතු සිදුකර ඇති බවට යම් ආකාරයකින් තහවුරු වූ ආයතන.

## 3. 2022 වසර සඳහා HCFC කෝටා ලබාදීම සඳහා සලකා බලනු ලබන ව්‍යාපාරික ආයතන

අ) පසුගිය වසර 5 තුළ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) භාවිතා කරමින් සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකලස් කිරීම සඳහා ශීතකරණ හා වායු සමන කර්මාන්තයේ නියැලී සිටින ව්‍යාපාරික ආයතන විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රමුඛතා පිළිවෙලට කෝටා පිරිනැමීමට සළකා බැලේ. ඔවුන් කර්මාන්තයේ නියැලී සිටින බවට සාක්ෂි ලෙස පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

a) දේශීය වෙළඳපලින් හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ශීතකාරක මිලදී ගත් බිල්පත් හා වෙනත් ලියකියවිලි
b) භාවිතා කරන ලද හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ශීතකාරක ප්‍රමාණය පෙන්නුම් කරන අභ්‍යන්තර ලියකියවිලි (බඩුවට්ටෝරු ලේඛනය, ආරක්ෂිත ලියකියවිලි, ගබඩා සටහන් නිකුත් කිරීම් හා කාර්මික ශිල්පීන් ආදිය)
c) අදාළ කාල සීමාව තුළ භාවිතා කරන ලද හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය පෙන්නුම් කරන වෙනත් ලියකියවිලි (සේවා ගිවිසුම් වැනි)

(ආ) ස්ථාවර වෙළඳපොලක් පැවතීම සහ කර්මාන්තය තුළ දැනටමත් ස්ථාපිත කර ඇති බෙදාහැරීමේ ජාලය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ සහතික කර ගැනීම සඳහා පසුගිය වසර 5 තුළ (2017-2021) හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය කිරීමේ නිරතව සිටින ව්‍යාපාරික ආයතන කෝටාව පිරිනැමීමේදී සළකා බලනු ලැබේ.මේ සම්බන්ධයෙන්, පහත සඳහන් ලියකියවිලි හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය කිරීමේ නියැලී සිටින බවට සාක්ෂි ලෙස සලකනු ලැබේ.

a) ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කරනු ලබන රේගු තක්සේරුකරුගේ සටහන සහිත රේගු සටහන්කරය (CUSDEC Form)
b) නෞවිබාර පත්‍රය/ගුවන්බාර පත්‍රය (Bill of Lading/ Air Way Bill)
( ශ්‍රී ලංකා රේගුවෙන් ගනු ලබන ආනයනික දත්ත වාර්තාව මඟින් ඉහත කරුණු සනාථ කරනු ලැබේ)
c) ආනයන පාලන බලපත්‍ර (ICL) සහ හර සටහන් පත්‍රය (Debit Note)
d) වාණිජ බිල්පත් (Commercial Invoice)

## HCFCs කෝටා ලබාදීමේ ක්‍රමවේදය

2009 සිට 2011 දක්වා ගණනය කරන ලද ආනයනික දත්තවලට අනුකූලව ශ්‍රී ලංකාව සඳහා වෙන් කර ඇති කෝටා ප්‍රමාණය ඕසෝන් ක්ෂයකාරක විභව ටොන් (ODPT) 13.9කි. මොන්ට්‍රියල් සන්ධානයේ 2F වගන්තියට අනුව, ඉහත වර්ෂයන්වල ගණනය කරනු ලැබූ ආනයනික දත්තවලින් (13.9ODPT) 10% ක් අඩු කළ පසු අගය වන 12.51 ODPT ප්‍රමාණය 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවට හිමි වාර්ෂික කෝටා ප්‍රමාණය ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. දෙවන අදියර යටතේ 2009-2011 පාදක අගයෙන් 35% ක් අඩු කළ පසු අගය වන 9.035ODP ප්‍රමාණය 2020 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවට හිමි වාර්ෂික කෝටා ප්‍රමාණය ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යා යුතුය.

ව්‍යාපාරික ආයතන අතර කෝටාව බෙදා හැරීම සඳහා වන ගණනය කිරීම් පහත ආකාරයට විස්තර කෙරේ. මෙහි ඉහත 2 වන වගන්තියේ සුදුසුකම් නිර්ණායක සපුරා ඇති ව්‍යාපාරික ආයතන සලකා බලනු ලබන්නේ 2022 වර්ෂය සඳහා කෝටාව ප්‍රදානය කිරීම සඳහා පමණි.

I. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව සඳහා වූ මුළු කෝටාව ODP ටොන් 9.035ක් ලෙස සැලකීම.
II. ඉහත (i)හි සඳහන් කෝටාවෙන් 5% ක් එනම් ODPT 0.4517 ක් හදිසි අවශ්‍යතා සඳහා වෙන් කරනු ලැබීම.
III. ඉතිරි 95% එනම් ODPT 8.5832 පහත පරිදි බෙදා හැරීම.

## 4.1 සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකලස් කිරීමේ ව්‍යාපාරික ආයතන

I. ඉහත 3 (අ) හි දක්වා ඇති තොරතුරු භාවිතා කරමින් පසුගිය වසර 5 (2017-2022) තුළ කර්මාන්තයේ නියැලී සිටින ව්‍යාපාරික ආයතන හඳුනා ගැනීම.

II. පසුගිය වසර 5 තුළ එනම් වසර 2017 සිට 2022 දක්වා එක් එක් ව්‍යාපාරික ආයතන විසින් සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකලස් කිරීම සඳහා භාවිතා කරන ලද හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය ගණනය කිරීම.

III. වසර 5 තුළ (2017-2022) එක් එක් ව්‍යාපාරික ආයතන විසින් සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකලස් කිරීම සඳහා භාවිතා කරන ලද හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණයේ සාමාන්‍ය අගය අනුව එක් එක් ආයතනය සඳහා හිමි කෝටාව ගණනය කිරීම.

IV. ඉහත (iii) හි සඳහන් ආකාරයට, ගණනය කිරීමේදී හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය 340Kg- 1360kg අතර ප්‍රමාණයක් හිමිකම් ලබන ආයතන සඳහා 1360kg ප්‍රමාණයක් ලබාදීම.

V. ඉහත (iii)හි සඳහන් ආකාරයට, ගණනය කිරීමෙන් හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය 1360kg -2720kg අතර ප්‍රමාණයක් සඳහා යම් ආයතනයක් හිමිකම් ලබයි නම් එම ආයතනය වෙත 2720kg ලබාදීම.

VI. ඉහත (iii)හි සඳහන් ආකාරයට, ගණනය කිරීමෙන් හයිඩ්‍රොක්ලෝ-රෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය 2720kg - 4080kg අතර ප්‍රමාණයක් සඳහා යම් ආයතනයක් හිමිකම් ලබයි නම් එම ආයතනය වෙත 4080kg ලබාදීම

VII. ඉහත (iii) හි සඳහන් කෝටාව ගණනය කිරීමේදී ලැබෙන අගය එක් එක් ව්‍යාපාර ආයතනය විසින් ඉල්ලන ලද කෝටා ප්‍රමාණයට වඩා වැඩිනම් ඉල්ලූ ප්‍රමාණය පමණක් ලබාදීම.

VIII. එක් එක් ව්‍යාපාර ආයතනය සඳහා වෙන් කරනු ලබන කෝටා ප්‍රමාණය විනිවිද ආකාරයට සෑම ආයතනයක් වෙතම දැනුම්දීමට කටයුතු කළ යුතුය.

## 4.2. හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් ආනයනය කරන ව්‍යාපාර ආයතන / පුද්ගලයින්

I. 4.1 හි සඳහන් සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ එකලස් කිරීමේ ව්‍යාපාරික ආයතන සඳහා කෝටාව ගණනය කිරීමෙන් පසු, ඉතිරි හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) කෝටා ප්‍රමාණය හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය කිරීමේ නිරතව සිටින ව්‍යාපාරික ආයතන අතර බෙදා හැරීම.

II. ඉහත 3 (ආ) හි දක්වා ඇති තොරතුරු භාවිතා කරමින් පසුගිය වසර පහක කාලය (එනම් 2017 සිට 2022 දක්වා) තුළ එම කර්මාන්තයේ නියැලී සිටින ව්‍යාපාරික ආයතන හඳුනා ගැනීම.

III. පසුගිය වසර 5 (2017-2022) තුළ එක් එක් ව්‍යාපාරික ආයතන විසින් ආනයනය කරන ලද හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) මුළු ප්‍රමාණය ගණනය කිරීම.

IV. එසේ එක් එක් ව්‍යාපාරික ආයතන විසින් පසුගිය වසර 05 (2017-2022) තුළ ආනයනය කරනු ලැබූ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය ගණනය කිරීම සහ ආයතන සියල්ල එක්ව ආනයනය කරනු ලැබූ සම්පූර්ණ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් HCFCs ප්‍රමාණයෙන් අදාළ ආයතනය කොපමණ ප්‍රතිශතයක් ආනයනය කළේද යන්න ගණනය කිරීම.

V. පසුගිය වසර 05 (2017-2022) තුළ ආයතන සියල්ල එක්ව ආනයනය කරන ලද සම්පූර්ණ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණයෙන් එක් එක් ව්‍යාපාරික ආයතන ආනයනය කරනු ලැබූ ප්‍රතිශතයට සමානුපාතිකව 4.2 (I) හි සඳහන් කෝටාව ව්‍යාපාරික ආයතන අතර බෙදාදීම.

VI. ඉහත (v)හි සඳහන් ආකාරයට, ගණනය කිරීමේදී යම් ආයතනයක් වෙත ලැබෙන හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) කෝටා ප්‍රමාණය 30,000kg සීමාව ඉක්මවා යන්නේ නම් එම ආයතනයට හිමි කෝටා ප්‍රමාණයෙන් 10%ක් අඩු කොට නිකුත් කිරීම සහ අඩු කළ ප්‍රමාණය ඉහත ගණනය කරන ලද අනුපාතයටම අනුව අනෙකුත් ආනයනකරුවන් අතර බෙදා හැරීමට කටයුතු කළ යුතුය. එසේ සිදු කරනු ලබන්නේ, වෙළඳපල ඒකාධිකාරිය වැළැක්වීමට සහ දෙවන අදියර යටතේ ශ්‍රී ලංකාවට හිමි වාර්ෂික කෝටා ප්‍රමාණය ලෙස 2009-2011 පාදක අගයෙන් 35% ක් අඩු කළ පසු අගය වන 9.035ODP ප්‍රමාණය

2020 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවට හිමි වාර්ෂික කෝටා ප්‍රමාණය ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු බැවින් සියළු ආනයනකරුවන් සඳහා වඩාත් සාධාරණ ආකාරයට ආනයන කෝටාව බෙදා හැරීම අරමුණු කර ගෙනය.

VII. ඉහත (v)හි සඳහන් කෝටාව ගණනය කිරීමේදී ලැබෙන අගය එක් එක් ව්‍යාපාර ආයතනය විසින් ඉල්ලන ලද කෝටා ප්‍රමාණයට වඩා වැඩිනම් ඉල්ලූ ප්‍රමාණය පමණක් වෙන් කිරීම හා එසේ ඉතිරි ප්‍රමාණය කෝටා ගණනය කිරීමේදී 340kg-4080 kg අතර ප්‍රමාණයක් හිමිවන ආනයනකරුවන් අතර පමණක් ඉහත ගණනය කරන ලද අනුපාතයටම අනුව අනෙකුත් ආනයනකරුවන් අතර බෙදාදීමට කටයුතු කළ යුතුය.

VIII. කිසියම් ව්‍යාපාරික ආයතනයක් 4.1 සහ 4.2 යන කාණ්ඩ දෙකම යටතේ සුදුසුකම් ලබන්නේ නම්, එහිදී අදාළ ආයතනයට වඩා වාසිදායක වන කාණ්ඩයක් යටතේ පමණක් සලකා බලනු ලැබේ.

IX. එක් එක් ව්‍යාපාර ආයතනය සඳහා වෙන් කරනු ලබන කෝටා ප්‍රමාණය විනිවිද ආකාරයට සෑම අයදුම්කරුවකු වෙතම දැනුම්දීමට කටයුතු කළ යුතුය.

## 5. අභියාචනා

එක් එක් ව්‍යාපාරික ආයතනය වෙත හිමි කෝටා ප්‍රමාණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු කෝටා බෙදාදීමේ ක්‍රමවේදයේ විනිවිදභාවය සහ සාධාරණත්වය තහවුරු කරනු සඳහා තෘප්තියට පත් නොවූ ආයතන හෝ පුද්ගලයින් සඳහා අභියාචනා ඉදිරිපත් කිරීම පිණිස සති 02ක කාලයක් ලබා දෙනු ලබයි. නියමිත කාල සීමාව තුළ ලැබෙන අභියාචනා සළකා බැලීම සඳහා පරිසර අමාත්‍යාංශයෙහි ලේකම් විසින් පත් කරනු ලබන නිලධාරීන්ගේ කමිටුවකට යොමු කළ යුතුය.අයදුම්කරුවකු විසින් හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) ආනයනය කිරීම සම්බන්ධ ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලක්, ඉල්ලීමක් හෝ යෝජනාවක් අභියාචනා කමිටුව විසින් සලකා බලනු ලැබේ. එම කමිටුවේ නිර්දේශ මත පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වනු ඇත. ව්‍යාපාරික ආයතන අතර කෝටාව බෙදා හැරීම සම්බන්ධව සියලු අයිතිවාසිකම් ද පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

## 6. භාවිතයට නොගත් කෝටාව නැවත බෙදා හැරීම

එක් එක් ආයතනය සඳහා වෙන් කරනු ලබන හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) කෝටා ප්‍රමාණය 2022 ඔක්තොම්බර් මස 31 දිනට පෙර ශ්‍රී ලංකා වරාය වෙත ගෙන්වීමට කටයුතු කළ යුතු වේ. කිසියම් ආයතනයක් හෝ පුද්ගලයෙක් එලෙස 2022 ඔක්තෝම්බර් මස 31 වන දිනට ප්‍රථම ශ්‍රී ලංකා වරාය වෙත අදාළ ගෑස් සිලින්ඩර් තොග ගෙන්වීමට අපොහොසත් වන්නේ නම් හෝ යම් ආයතනයක් විසින් හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) කෝටාව ආනයනය කිරීමේදී යම් නිත්‍යානුකූල නොවන කටයුත්තක් සිදුකළ බවට අනාවරණය වන්නේ නම් එම ආයතනයට හෝ පුද්ගලයා වෙත හිමි කෝටාව වෙනත් ආයතනයකට හෝ පුද්ගලයකුට ලබාදීමට කටයුතු කරනු ලැබේ. මේ සඳහා වසර ආරම්භයේදී අයදුම් කරනු ලබන ආයතන හෝ පුද්ගලයින් අතුරින් පමණක් තරඟකාරී මිල ගණන් කැඳවා HCFC කිලෝග්‍රෑමයක් සඳහා වැඩිම ලංසුව ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා හෝ ආයතනය වෙත කෝටාව ලබාදීමට පියවර ගනු ලැබේ.එලෙස ලබාදෙනු ලබන කෝටාවට අදාළව ආනයන කරනු ලබන හයිඩ්‍රොක්ලෝරෝ-ෆ්ලෝරෝකාබන් (HCFCs) ප්‍රමාණය ද 2022 වසරේ දෙසැම්බර් 31 වන දිනට පෙර රේගුවෙන් නිෂ්කාශණය කළ යුතුය.

## 7. හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් ආනයනය කරන ව්‍යාපාර ආයතන / පුද්ගලයින් අදාළ වර්ෂයේ හිමි කෝටාව ආනයනය නොකිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග

යම්කිසි ආයතනයක් හෝ පුද්ගලයකුට අදාළ වර්ෂය තුළ හිමි කෝටාව එම වර්ෂය තුළ ආනයනය කිරීමට නොහැකි වුවහොත් එම පුද්ගලයාගෙන් හෝ ආයතනයෙන් ඒ සම්බන්ධයෙන් ලිඛිතව විමසීමක් සිදු කරනු ලබයි. එහිදී අදාළ ආයතනය හෝ පුද්ගලයාට ඒ සම්බන්ධයෙන් සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ විට ඊළඟ වර්ෂයේ එම ආයතනයට හෝ පුද්ගලයාට හිමි කෝටා ප්‍රමාණයෙන් ගෙන්වීමට නොහැකි වූ ප්‍රමාණය අඩුකළ විට ලැබෙන කෝටා ප්‍රමාණය අදාළ වර්ෂයේ හිමි කෝටාව ලෙස සළකනු ලැබේ. එසේම එසේ අඩුකළ ප්‍රමාණය අනෙකුත් ආයතන හෝ පුද්ගලයින් වෙත සමානුපාතිකව බෙදා දෙනු ලැබේ.

## 8. වංචනික ලෙස ගෙන්වන ලද ගෑස් තොග සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග

කිසියම් ආයතනයක් හෝ පුද්ගලයෙක් මොන්ට්‍රියල් සන්ධානයේ ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් පනවා ඇති නීතිරීති උල්ලංඝනය කරමින් වංචනික ලෙස කටයුතු කරනු ලබන බවට හෙළිදරව් වුවහොත් එවැනි ආයතනය හෝ පුද්ගලයින් ඉදිරි වසරවල කෝටා ඉල්ලුම් කළ නොහැකි වන අයුරින් අසාධුලේඛන ගත කිරීමට කටයුතු කරනු ලැබේ.